# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2119/15 – 2019 අප්‍රේල් 18 වැනි බ්‍රහස්පතින්දා – 2019.04.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/21/07/2007.

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2010.01.21 දිනැති හා අංක 1637/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2010.01.12 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පිටකෝට්ටේ, කෝට්ටේ පාර, අංක 416 හි පිහිටි ජාතික සේවක සංගමය හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 07, නිදහස් චතුරස්‍රය හි පිහිටි ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.02.08 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අප්‍රේල් මස 03 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 29901 – 11 (2019/04)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ප්‍රදානය

**කාර්මික අධිකරණයේ දී ය.**

ඒ. යමුනා විනෝදනී ද අල්විස් මහත්මිය වෙනුවෙන් ජාතික සේවක සංගමය.

*අංකය: ඒ - 3320*
අයිආර්/21/07/2007

*ඉල්ලුම්කරු*

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

*වගඋත්තරකරු*

**තීන්දුව**

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය ප්‍රකාර ව යොමු කරන ලද ඉහත අංක දරන අයදුම්පතට විෂය වූ කාරණය, ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත්කිරීම අපගේ බේරුම්කරණ පටිපාටියේ මුඛ්‍ය අරමුණ විය.

වර්ෂ 2009.12.12. දිනැති මූලික යොමු කිරීම මගින් විවිධ වෘත්තිය සහ සේවා පදනම්වලට අයත් දහ අට (18) දෙනෙකු විසින් ඉල්ලුම්කරුවන් ලෙස කම්කරු කොමසාරිස්වරයා වෙත කරන ලද ඉල්ලීම් සඳහන් කරමින් ඒවා එකිනෙක යුක්තිසහගත ද යන්න සහ ඔහුට හෝ ඇයට කුමන සහනයක් හිමි විය යුතු ද යන්න සළකා බලා තීරණය කිරීමේ වගකීමක් අප වෙත පවරා තිබුණි.

කෙසේ වුවද එකී යොමු කිරීමේ විවිධ වෘත්තිය ගැටලු ඉදිරිපත් කරන ලද ඉල්ලුම්කරුවන් අතුරින් දහහත් (17) දෙනෙකුම තම ඉල්ලුම්පත් එලෙසම පවත්වා ගෙන යාමට විවිධ කාරණා මත අපොහොසත්වීම හේතුවෙන් අවසානයට ඉතිරි වූ එක් ඉල්ලුම්කාරියකගේ අයදුම්පත සළකා බැලීමට තීරණය කළෙමි. අදාළ යොමු කිරීමේ අංක 08 යටතේ සඳහන් ඉල්ලුම්කාරිය ගේ ඉල්ලීම යුක්තිසහගත ද යන්න සහ ඇයට කුමන සහනයක් හිමි විය යුතුද යන්න විමසා බලා තීරණය කිරීම මෙම අධිකරණයේ වගකීම විය.

මෙම ඉල්ලුම්කාරිය ගේ ඉල්ලීම සම්බන්ධයෙන් කරුණු සළකා බලා නිගමනයකට ඒමට පෙර දෙපාර්ශවය අතර සමථයක් ඇත්ද සහ ඇති කරගත හැකි ද යන්න විමසා බැලූ නමුදු සමථයක් නොමැති බව පැහැදිලි විය. ඉන් අනතුරුව සිදු විය යුතු ආකාරයට වර්ෂ 2011 නොවැම්බර් මාසයේ සිට 2018 අප්‍රියෙල් මස දක්වා ම වර්ෂ හයකට වැඩි කාලයක් තිස්සේ මෙම ඉල්ලුම්පත විභාග කිරීමට සිදු විය.

පළමුවරට ඉල්ලුම්කාරියගේ මූලික සාක්ෂිය සටහන් කර ගන්නා ලද්දේ 2014.09.30 වැනි දිනය. එම මූලික සාක්ෂිය 2014.10.30 වැනි දින දක්වා සටහන් කර ගනු ලැබූ අතර, වගඋත්තරකාර පාර්ශවයේ හරස් ප්‍රශ්න ඇසීම සහ නැවත ප්‍රශ්න අවසන් වූයේ 2016 ජූලි මස 29 වැනි දින යි.

ඉන් අනතුරුව වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් සාක්ෂිය මෙහෙයවීම ආරම්භ වූයේ 2017.02.07 වැනි දිනය. එදින මූලික සාක්ෂිය මෙහෙයවීම ඇරඹී 2017.02.28 දින අවසන් වූ අතර, ඉල්ලුම්කාරිය වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීම 2017.07.10 දින අරම්භ කර අවසන් කරන ලද්දේ 2018.01.10 වැනි දින ය.

දෙපාර්ශවය විසින් ලිඛිත දේශන ගොනු කර ඇති ඉල්ලුම්කාර වගඋත්තරකාර සාක්ෂි විභාගයන්, ලකුණු කරන ලද, ඔප්පු කරන ලද ලේඛන සහ ලිඛිත සැළකිරීම් ද සැළකිල්ලට ගනිමින් සාධාරණ වූත්, යුක්තිසහගත වූත් තීන්දුවක් ප්‍රකාශ කිරීම මාගේ අභිප්‍රාය විය.

**අයදුම්පතට පාදක වූ කාරණය**

මෙම අංකය යටතේ වූ යොමුව මුල් අවස්ථාවේ දී ඉදිරිපත් කර තිබුණේ ඉල්ලුම්කාරයන් (18) දහඅට දෙනකු සම්බන්ධයෙන් මතු වූ කාර්මික ආරාවුලක් පදනම් කරගෙනය. ඒ සියලු දෙනා වගඋත්තරකාර සංස්ථාවේ විවිධ වෘත්තීය සහ සේවා අංශයන්ට අනුයුක්තව සේවය කරන්නෝ වූහ. ඔවුන් සියලුදෙනා සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයා විසින් සංක්ෂිප්ත විස්තරයක් සහිතව මෙම යොමු කිරීම කරන ලද අතර එයින් අනෙක් සියලු දෙනා හැර මෙම ඉල්ලුම්කාරියගේ අයදුම්පත බේරුම්කරණය සඳහා ගැනීමට ඉතිරි විය.

අප ඉදිරිපිට එකී ඉල්ලුම්කාර යමුනා විනෝදනී ද අල්විස් යන අයගේ ඉල්ලීම දීර්ඝ වශයෙන් විමසීමට සිදු වූයේ ඉල්ලීම සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර සමථයක් ඇති කර ගැනීමට නොහැකි වූ නිසාය. ඇය සම්බන්ධයෙන් ප්‍රස්තුත යොමුව වන්නේ සංගීත අධ්‍යක්ෂ තනතුර හෝ අතිරේක අධ්‍යක්ෂ තනතුරක් ලබා දෙන ලෙසට කරන ලද ඉල්ලීම යුක්ති සහගත ද යන්න හා ඇයට කුමන සහනයක් හිමි ද යන්න වේ.

**සාක්ෂි සහ ලේඛන**

ඉල්ලුම්කාරිය සාක්ෂි දෙමින් තමා ගීත සම්පාදක නිලධාරිනියක වශයෙන් 1981.01.21 වැනි දින වගඋත්තරකාර සංස්ථාවේ සේවයට බැඳුණු බවත්, සාක්ෂිය දෙන අවස්ථාව වන විට වර්ෂ 33 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබූ බවත්, සිව් වතාවක් සම්මුඛ පරීක්ෂණවලට ඉදිරිපත් වී ඇති බවත් ප්‍රකාශ කළාය. එසේම සංගීතය පිළිබඳව අධ්‍යාපනික සුදුසුකම් මෙන්ම වෘත්තීය පළපුරුද්ද ද තමා සතු බව ලේඛන ලකුණු කරමින් ඉල්ලුම්කාරිය සාක්ෂි දී ඇත.

එලෙස 1981 වර්ෂයේ දී ගීත සම්පාදන නිලධාරිනියක ලෙස සේවයට බැඳුණු ඉල්ලුම්කාරිය 1993 වර්ෂයේ දී නිෂ්පාදක තනතුර ලැබූ බව ද, 2001 වර්ෂයේ දී ජ්‍යෙෂ්ඨ සංවිධායක ලෙස උසස්වීම් ලැබූ බව ද, 2002 වර්ෂයේ දී සහකාර සංගීත අධ්‍යක්ෂ තනතුරේ පත්වීම ලද බව ද සිය සාක්ෂියේ දී ප්‍රකාශ කළාය. ඉල්ලුම්කාරියගේ මූලික සාක්ෂියෙන් කියැවෙන පරිදි සහකාර සංගීත අධ්‍යක්ෂ තනතුරට පත් වූ ඇය ඊට අමතරව සංගීත අධ්‍යක්ෂ තනතුරේ ද රාජකාරි ආවරණය කොට ඇත.

සහකාර සංගීත අධ්‍යක්ෂ ධූරයේ කටයුතු කරන අතරේ ම සංගීත අධ්‍යක්ෂ ධූරයේ කටයුතු ආවරණය කිරීමට හෝ වැඩ බැලීමට ඉල්ලුම්කාරිය පත් කරන ලද්දේ එම සංගීත අධ්‍යක්ෂ ධූරය පුරප්පාඩු වී තිබීම නිසා ය. එසේ පැවතිය දී 2003 වර්ෂයේ දී සංගීත අධ්‍යක්ෂ ධූරයට සුදුස්සකු බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත් කැඳවූ නමුත් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවීමක් නොකළ බවද, 2004 වර්ෂයේ නැවත ඉල්ලුම්පත් කැඳවූ බව ද ඉල්ලුම්කාරිය සිය සාක්ෂියේ දී කියා සිටියා ය. ඉල්ලුම්කාරිය විසින් ''ඉ9'' වශයෙන් ලකුණු කරන ලද ලේඛනයෙහි සඳහන් වූ තනතුරට අදාළ සුදුසුකම් ''ඉ10'' වශයෙන් ලකුණු කරන ලද ලේඛනය මගින් වෙනස් කර තිබුණු බව ද ඇයගේ සාක්ෂියේ සඳහන් ය.

ඉල්ලුම්කාරිය වෙනුවෙන් සාක්ෂි දීම සඳහා සංස්ථාවේ අතිරේක අධ්‍යක්ෂ ධූරයක් ද දරන අයකු කැඳවන ලද අතර ඔහුගේ සාක්ෂිය ද සටහන් කර ගන්නා ලදී. ඔහු වගඋත්තරකාර පාර්ශවයේ හරස් ප්‍රශ්නවලට ද ලක් විය.

**වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂිය**

වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් සාක්ෂිය නිල සාක්ෂිකරුවකු මගින් ඉදිරිපත් කරනු ලැබීය. එකී සාක්ෂිය ආරම්භ වූයේ 2017.02.07 වැනි දින ය.

වගඋත්තරකාර සංස්ථාවේ අධ්‍යක්ෂ (පිරිස්) මගින් සාක්ෂි මෙහෙයවන ලද අතර, ඉල්ලුම්කාරිය සංස්ථා සේවයට බඳවා ගැනීමේ සිට ඉල්ලුම්පත් කැඳවීමෙන් සහ සංස්ථා මණ්ඩල පත්‍රිකා මගින් දෙන ලද උසස්වීම් ද ඊට අදාළ ලේඛන ලකුණු කරමින් සාක්ෂි ලබාදෙන ලදී.

විශේෂයෙන් -

(අ) පුවත්පත් දැන්වීම් පළකර ඉල්ලුම් පත්‍ර කැඳවීම
(ආ) ආයතනය තුළින්ම සහ බාහිරව ද ඉල්ලුම්පත් කැඳවීමේ ක්‍රියාවලිය
(ඇ) සම්මුඛ පරීක්ෂණ සහ එකී පරීක්ෂණ මණ්ඩලවලට සුදුස්සන් පත්කර ගැනීම
(ඈ) සම්මුඛ පරීක්ෂණ පවත්වා සුදුස්සන් තෝරා ගැනීම සඳහා නිර්දේශ ලබාගැනීම ආදිය සම්බන්ධයෙන් එකී සාක්ෂි මෙහෙයවීම යොමු විය.

**දෙපාර්ශවයේ සාක්ෂි සහ හරස් ප්‍රශ්න සම්පිණ්ඩනය:**

ඉල්ලුම්කාරියගේ සාක්ෂියේ දී සහ අසන ලද හරස් ප්‍රශ්නවල දී මතු වූ ප්‍රබල කාරණා මාගේ නිරීක්ෂණයට ලක් විය. මෙම ඉල්ලුම්පතට අදාළ තනතුර සඳහා ඇය පත් නොකිරීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවයේ ස්ථාවරය වූයේ නියමිත පරිපාටිය ඔස්සේ පරීක්ෂණ මණ්ඩලයක් පත්කර සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එකී මණ්ඩලයේ තීරණය අනුව වැඩිම ලකුණු ලබාගත් අපේක්ෂකයා තෝරා ගත් බව ය. එකී පරීක්ෂණයට බාහිරින් නම් කර තිබුණේ අදාළ විෂයය සම්බන්ධ ප්‍රවීණයන් බව ද තවදුරටත් ප්‍රකාශ විය. ආර් 2 වශයෙන් ලකුණු කරන ලද ලේඛනය ද සම්මුඛ පරීක්ෂණයට මුහුණ දුන් අපේක්ෂකයන් ලබා ගත් ලකුණු සංඛ්‍යාව ද, එකී ප්‍රතිඵල සනාථ කළ සම්මුඛ පරීක්ෂණය සිදු කළ සාමාජික සාමාජිකාවන් ගේ නාමාවලිය ද අත්සන් ද එහි අඩංගුය. බාහිරින් නම් කරන ලද (1) ආචාර්ය ප්‍රේමසිරි කේමදාස (2) ආචාර්ය අමරා රණතුංග (3) මහනාම වික්‍රමසිංහ යන ක්ෂේත්‍රයේ විද්වතුන් හැරුණු කොට සභාපතිවරයාත්, අමාත්‍යාංශයේ අතිරේක ලේකම් කාන්ති විජේතුංග සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රවෘත්ති) සෝමපාල පෙරේරා යන අය නිල නියෝජිතයන් ලෙස සැළකිය හැකිය. විද්වතුන් ලෙස බාහිරින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට නම් කරන ලද ආචාර්ය ප්‍රේමසිරි කේමදාස මහතා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට සහභාගි වී නොමැති බව ද හෙළි වේ. මෙහි දී නිරීක්ෂණය කළ හැකි වන්නේ නිල නියෝජනයන් තුනක් ඇති අවස්ථාවක බාහිර විද්වතුන් ලෙස සහභාගි වී ඇත්තේ දෙදෙනකු පමණක් බව ය. නම් කරන ලද සාමාජිකයන් තුන් දෙනකු අතුරින් එක් විද්වත් ප්‍රවීණ සාමාජිකයකු සහභාගි නොවූ පසුබිමක් තුළ ඒ පුරප්පාඩුව නොපුරවා සම්මුඛ පරීක්ෂණය පවත්වා තීරණ ගැනීමෙන් මෙම ඉල්ලුම්කාරියට පමණක් නොව ඕනෑම අපේක්ෂකයකුට අසාධාරණයක් විය හැකි ව තිබූ බවට යම් සංශයක් ඕනෑම අපේක්ෂකයකු තුළ ඇති විය හැකි ය.

වැඩි ම ලකුණු ලබාගත් ගාමිණී රංජිත් විජේසේකර යන අය සංගීත අධ්‍යක්ෂ තනතුරට තෝරා ගනු ලැබූ අතර දෙවනුවට ඉහළ ලකුණු ලබා තිබුණේ මෙහි ඉල්ලුම්කාරිය බව ප්‍රතිඵල විමර්ශනයේ දී පැහැදිලි වෙයි. එසේ වුවද ගාමිණී රංජිත් විජේසේකර යන අය කැසට්පට ප්‍රකාශන අංශයේ රාජකාරි ආවරණයට පත්කරනු ලැබූ අවස්ථාවේ යම් පුරප්පාඩුවක් ඇතිවූයේ වුවද, සංගීත අධ්‍යක්ෂ ධූරයේ වගකීම් ආවරණය කිරීමට වෙනත් පුද්ගලයෙකු යොදවා ගැනීමට කටයුතු කර ඇතත් සම්මුඛ පරීක්ෂණයේදී දෙවන ඉහළ ලකුණු ලබාගත් ඉල්ලුම්කාරිය පත්කර ගැනීමට පරිපාලනය උනන්දු නොවූයේ හෝ කටයුතු නොකළේ කුමන හේතුවක් නිසා ද යන්න සැක සහිත ය.

වගඋත්තරකාර පාර්ශවය ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න ඇසීමේ දී මෙන් ම ලිඛිත සැළකිරීම්වල දී ද වැඩි අවධානයකින් අවධාරණය කළ කාරණය වන්නේ මෙම ඉල්ලුම්පත ඉදිරිපත් කිරීමට පෙර ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කර එය විභාගයට නොගෙන අවසර දීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙනි. ශ්‍රී ලංකාවේ ඉහළ ම අධිකරණය වෙත ඉල්ලුම්කාරිය විසින් ඉදිරිපත් කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සමට පාදක වූ කරුණු ම කම්කරු කොමසාරිස්වරයා වෙත කරන ලද අයැදීමේ දී ද පාදක කරගත් බවට නගන තර්කය මම පිළිගනිමි. එසේ වුව ද මූලික අයිතිවාසිකම් පෙත්සමින් ඉල්ලා ඇති සහනයන් පමණක් කම්කරු කොමසාරිස්වරයා ඉදිරියේ ඉල්ලා සිටි අවස්ථාවේ දී වගඋත්තරකාර පාර්ශ්වයෙන් විරෝධයක් එල්ල වූයේ ද, එවැනි විරෝධයක් එල්ල වූයේ නම් ඊට කම්කරු කොමසාරිස්වරයා ගත් ස්ථාවරය කුමක් වී ද යන්න හෝ වගඋත්තරකාර පාර්ශ්වයෙන් හෙළිදරව් නො කෙරිණි.

කම්කරු කොමසාරිස්වරයා ඉදිරියේ සියලු පාර්ශවයන් කැඳවා ප්‍රස්තුත කාරණය සම්බන්ධයෙන් පැවැත්වුණු පරීක්ෂණය මත කරන ලද නිර්දේශ සහිත 2009.03.27 දිනැති ලිපිය ''ඉ17'' වශයෙන් ඉල්ලුම්කාරිය වෙනුවෙන් ලකුණු කර ඉදිරිපත් කරන ලදි. එහි ''ඉ17බී' කොටස පහත සඳහන් පරිදි වේ.

> ''එම සාකච්ඡාවල දී අනාවරණය වූ කරුණු හා අදාළ පැමිණිලි පාර්ශවයන් විසින් මා වෙත ඉදිරිපත් කරන ලද ලිඛිත සැළකිරීම් ද සුපරීක්ෂාකාරී ව අධ්‍යයනය කරන ලදී. ඒ අනුව මෙම ආරාවුල සම්බන්ධයෙන් පහත සඳහන් නිර්දේශයන් ඔබ වෙත යොමු කරනු කැමැත්තෙමි. ඒ අනුව මෙම සේවක සේවිකාවන්ට නිර්දේශිත සහනයන් ලබා දෙන ලෙස කාරුණික ව ඉල්ලා සිටිමි. යම් හෙයකින් මේ සම්බන්ධයෙන් යහපත් ප්‍රතිචාරයක් නොලැබුණහොත්, මෙම ආරාවුල කාර්මික ආරාවුල් පනතේ විධිවිධානයන් යටතේ බේරුම් කිරීම මගින් විසඳීමට යොමු කිරීම නිර්දේශ කරනු ලබන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.''

එහි ම ''ඉ17සී'' යන කොටසේ සඳහන් වන පරිදි කම්කරු කොමසාරිස්වරයාගේ නිර්දේශය වූයේ ඉල්ලුම්කාරිය විසින් අපේක්ෂිත අධ්‍යක්ෂ සංගීත තනතුර හෝ අතිරේක අධ්‍යක්ෂ තනතුරක් ලබාදෙන ලෙස ය.

කම්කරු කොමසාරිස්වරයා යනු ව්‍යවස්ථාපිත අණපනත්වල 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත යටතේ ස්ථාපිත තනතුරකි. එවැනි ධූරයක නිර්දේශයක් ලැබී තිබියදීත් ඒ බව නොසළකා දිගින් දිගටම කටයුතු කිරීම පාලනාධිකාරයක අත්තනෝමතික, නීතිමය විධිවිධානවල අපේක්ෂිත හරයන් උල්ලංඝණය කරන දෘඪ පිළිවෙතක් බවට නිගමනය කළ යුතුය. එකී නිර්දේශය වැරදි සහගත නීතියට පටහැනි එකක් ලෙස බවට පාලනාධිකාරියේ අදහස වූයේ නම් ඊට විරුද්ධ ව සුදුසු අධිකරණමය සහන අපේක්ෂා කළ හැකි ව තිබුණි. වගඋත්තරකාර පාර්ශවය මෙම නඩුවේ සියලු අවස්ථාවන්හි දී ම එකී කොමසාරිස්වරයාගේ නිර්දේශය අභියෝගයට ලක් කර නො තිබුණු බව ද සඳහන් කළ යුතු ය.

වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් පිරිස් අධ්‍යක්ෂවරයා ගේ සාක්ෂියේ දී ඔහු ජාතික ආධුනිකත්ව මණ්ඩලයේ පුහුණුවකින් පසුව ප්‍රාථමික තනතුරකට වගඋත්තරකාර සංස්ථාවට බැඳී සාක්ෂි දෙන අවස්ථාව වන විට අධ්‍යක්ෂ පිරිස් තනතුරට පත් වූ ආකාරය විස්තර කර ඇත. ඉල්ලුම්කාරිය වෙනුවෙන් නගන ලද හරස් ප්‍රශ්නවල දී ද පියවරෙන් පියවර දැනට ස්ථාපිත තනතුරට පත් වන තෙක් උසස්වීම් ලැබූ ආකාරය සඳහන් කර ඇත.

හරස් ප්‍රශ්නවල දී සාක්ෂි දෙමින් පිළිගත් පරිදි සහකාර අධ්‍යක්ෂ තනතුරේ සිට අධ්‍යක්ෂ පිරිස් තනතුරට තමා පත් නොකිරීම හේතුවෙන් එකී අසාධාරණය මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කළ අතර එයින් ලබා දුන් නිර්දේශයන් මත ඔහුට අධ්‍යක්ෂ පිරිස් තනතුර ලබා දී ඇත.

ඉල්ලුම්කාරිය සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයා විසින් ලබාදුන් නිර්දේශය නොතකා හැර කටයුතු කරන්නටත් සංස්ථාව වෙනුවෙන් අප ඉදිරියේ සාක්ෂි දීමට සුදුසුකම් ලැබූ සාක්ෂිකරු සම්බන්ධයෙන් ලබාදුන් නිර්දේශය එසැනින් ක්‍රියාත්මක කරන්නටත් වගඋත්තරකාර සංස්ථාව ක්‍රියාකිරීම කුමන හේතු මත සිදු වූයේ ද යන්න පැහැදිලි ව විද්‍යාමාන නොවෙතත් සියුම් උපක්‍රමශීලි ආකාරයෙන් දියත් වූ අසාධාරණයක් ප්‍රකට වන බව නිගමනය කළ හැකි ය.

### ප්‍රදානය

ඉහත සඳහන් කළ කරුණු මත ඉල්ලුම්කාරියට දීර්ඝ කාලයක් තිස්සේ යම් අසාධාරණයක් සම්බන්ධයෙන් නානාවිධ නීතිමය පියවරයන්ට යාමට සිදු වී ඇති බව ද මුල් අවස්ථාවල දී කාර්මික සාමයක් අපේක්ෂා කළේ නම් වගඋත්තරකාර පාලනාධිකාරියට දෙපාර්ශවයට ම පිළිගත හැකි අවබෝධයෙන් යුතු තීන්දු තීරණවලට එළැඹීමේ හැකියාවක් තිබූ බව ද මම නිගමනය කරමි.

කෙසේ වුව ද, ඉල්ලුම්කාරිය වසර පහළොවක පමණ කාලයක් තිස්සේ ඉල්ලා සිටි තනතුර ඇයට ප්‍රදානය කිරීම මෙම අවස්ථාවේ දී ප්‍රායෝගික නොවන බව පිළිගනිමින්, ප්‍රදානය කළ හැකි උපරිමය වශයෙන් වන්දි මුදලක් ලෙස වගඋත්තරකාර සංස්ථාව විසින් ඉල්ලුම්කාරියට රුපියල් තුන්ලක්ෂයක (රු, 300,000/-) මුදලක් ගෙවිය යුතු බවට නියෝග කරමි.

බේරුම්කරු.

වර්ෂ 2019 ක් වූ පෙබරවාරි මස 08 වැනි දින.

05 – 39

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.